# සමාජයේ යහපැවැත්මට අවශ්‍ය නීති රීති සන්නිවේදනය කිරීමේදී ශ්‍රී ලංකාවේ අභිලේඛන මූලාශ්‍ර මගින් ඉදිරිපත් වන තොරතුරු පිළිබඳ විමර්ශනයක්

ජේ. සුදර්මා ප්‍රේමසිරි[1]

## හැඳින්වීම

ලක්දිව මානව සන්නිවේදනයේ ඉතිහාසය පිළිබඳව විමසා බැලීමේදී අභිලේඛනවලට හිමි වන්නේ සුවිශේෂී වූ ස්ථානයකි. එකල සමාජයේ තොරතුරු සන්නිවේදනය කිරීමේ එක් ප්‍රබල මාධ්‍යයක් වශයෙන් අභිලේඛන ප්‍රමුඛ විය. පැරණි සමාජ ක්‍රමය කිසියම් නීති රීති මාලාවකට අනුකූලව හැඩ ගැසී පැවති බව පෙනේ. ඉපැරණි රජ දරුවන් විසින් සමකාලීන ජනතාවට පිළිපැදීමට අවශ්‍ය නීති රීති ශිලා ලිපිවල කොටවා ඒවා ජනතාව නිතර ගැවසෙන තැන්වල පිහිටුවනු ලැබීය. මෙමගින් රජයේ අණ පනත්, නීති රීති, ප්‍රදානයන් සන්නිවේදනය කෙරිණි. එමගින් යහපත් වූ සමාජ පරිසරයක් නිර්මාණය කිරීමට එකල රජවරුන් අපේක්ෂා කරන්නට ඇතැයි සිතිය හැකිය. මානව සමාජයට අවශ්‍ය නීති රීති අභිලේඛන මගින් සන්නිවේදනය කළ ආකාර විමසා බැලීමත්, සමාජයේ යහපත උදෙසා පැනවූ නීති රීතිවල ස්වභාවය, නීති කඩ කළ පිරිසට ලබා දුන් දඬුවම් කවරේද යන්න විමසා බැලීම ද මෙහි අරමුණු වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රය පරිශීලනය මෙහි පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගැනුණි. Epigraphia Zelanica, ශිලාලේඛන සංග්‍රහය, ලක්දිව සෙල්ලිපි යන ග්‍රන්ථ මූලාශ්‍රය වශයෙන් භාවිතා කෙරිණ.

## අන්තර්ගතය

එකල සමාජයේ මිනිසුන් නොයෙකුත් වෘත්තීන්වල නිරත වූ බව පෙනේ. විශේෂයෙන් වෙළඳාම ඒ අතර වැදගත් විය. බොහෝ පිරිසක් තමන්ගේ ජීවිත ගෙන ගියේ කෘෂිකර්මාන්තයට අමතරව වෙළඳාමෙනි. මේ නිසා වෙළඳාම් කරන ජනතාවට ද කිසියම් නිතී රීති මාලාවක් සන්නිවේදනය කිරීමට අභිලේඛන සමත් වී ඇති බව පෙනේ. මේ සඳහා නිදසුනක් ලෙස බදුලු ටැම් ලිපිය සඳහන් කළ හැකිය. පොහොය දිනවල වෙළඳාම් නොකිරීම එකළ පැවති නීතියක් බව පෙනේ. මෙය සමාජයේ ජනතාව සිලවත් පිරිසක් බවට පත් කිරීම සඳහා ගන්නා ලද උත්සාහයක් බව පෙනේ. වෙළඳාම් කිරීමට පමණක් නොව පින් දහම් කටයුතුවලටත් ඔවුන් යොමු කිරීම සමකාලීන රජවරුන්ගේ අරමුණ වන්නට ඇත.

1 සහකාර කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
jspsudarma@gmail.com

එසේම සමාජයේ වෙළඳාම් කරන පුද්ගලයන්ගේ වංචනික ක්‍රියාවන් නතර කරවාලීම සඳහා ද ඇතැම් කරුණු සන්නිවේදනය කර ඇති බව පෙනේ. වංචනික වෙළඳාම් ක්‍රම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ද යලි එවැනි සිදුවීම් වීම වළක්වා ගැනීම ද රජුගේ බලාපොරොත්තුව වන්නට ඇත. බුලත් පුවක් මණ්ඩපයක තබා විකිණීම කළ යුතු බව දක්වයි. වෙළඳ නීති රීති ගණනාවක් ම මෙන්ම සමාජ නීති රීති ගණනාවක් ම තෝනිගල ශිලා ලිපිය මඟින් සමකාලීන මහජනතාවට දැනුම් දී ඇති බව පෙනේ. එමෙන්ම නීති රීති උල්ලංඝණය කළවුන් බලු කවුඩු වන බව දක්වමින් මිනිසුන් අතින් සිදුවිය හැකි වැරදි අවම කිරීමට මෙමඟින් උත්සාහ ගත් ආකාරයක් පෙන්නුම් කෙරේ.

එමෙන්ම අර්ථයෙන් මෙන්ම ධර්මයෙන් ගිහි ජනතාවට අවවාද අනුශාසනා ලබා දෙමින් ශාසනයේ චිරස්ථිතිය උදෙසා සුවිශාල මෙහෙවරක් ඉටු කරන භික්ෂූන් වහන්සේලා මූලික කරගෙන සමස්ත භික්ෂු ශාසනයේ ම පැවැත්ම අරඹයා නීති රීති පනවා තිබුණි. මිහින්තලා පුවරු ලිපිය තුළින් ද විහාරයක් සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාව පිළිපැදිය යුතු නීති රීති මාලාවක් සන්නිවේදනය කර ඇත. භික්ෂු සංඝයාට අයත් ස්ථානවල කුඹුරු ආරාම ආදිය ජනතාව විසින් පරිභෝජනය නොකළ යුතු විය. විහාර භූමියේ සිටින ගම් වැසියන් නිසි පරිදි බිම් බද්ධ ගෙවිය යුතු ය. තුන් දිනකට ලැබෙන නිවාඩු හැර බොහෝ නිවාඩු නොගත යුතුය. විහාරයේ වෙසෙන දාසයන් තමන්ට විහාරයෙන් ලැබෙන දෙයක් මිස වෙනත් යමක් නොගත යුතු බව දක්වා ඇත.

විහාරගම් වැසියන්ට ද නීති රීති පැනවීම තුළින් වෙහෙර විහාර සහ සාමාන්‍ය ජනතාව අතර මනා සම්බන්ධයක් ඇති කිරීමට කටයුතු කළ බව සිතිය හැකිය. සමාජයේ ජනතාවට නිරන්තරයෙන් භික්ෂූන් වහන්සේලාගේ සේවාව, පිහිට අවශ්‍ය වේ. මෙවැනි නීති රීති මාලාවක් සන්නිවේදනය කිරීම තුළින් භික්ෂූන් වහන්සේලා හා මහජනතාව අතර ඇතිවන ගැටලු අවම වේ. රටවැසියා සමගි ව තබා ගැනීම ද රජුට පැවරුණ භාරදූර කාර්යයකි. එබැවින් විහාරගම්වල වාසය කරන ජනතාවට පවා කිසියම් නීති රීති මාලාවක් දැනුම්දීම තුළින් අනෙක් රටවැසියා සමඟ ද සාමකාමී සම්බන්ධතා පවත්වාගෙන යාමට පිටිවහලක් වන්නට ඇත.

සමාජයේ මිනිසුන් හට පවරනු ලැබූ නීති රීතීන් අතර රජයේ නිලධාරීන්ට ද නීති රීති පනවා ඇති බව අභිලේඛන මඟින් පැහැදිලි වේ. අතීත සමාජයේ යහපත් නිලධාරීන් පිරිසක් ඇති කර ගැනීම රජුගේ අරමුණ වන්නට ඇත. රජයේ නිලධාරීන් ද සාමාන්‍ය ජනතාව මෙන් විහාර සම්බන්ධයෙන් පිළිපැදිය යුතු නීති රීති ගණනාවක් ම අභිලේඛන මඟින් දැනුම් දී ඇත්තේ මේ හේතුවෙන් වන්නට ඇත. ඔවුන්ගෙන් භික්ෂූන් වහන්සේලා හට සිදුවිය හැකි අපහසුතා මඟ හරවාලීමට රජු කටයුතු කළේ මෙලෙස සමාජ සම්මත වූ නීති රීති මාලාවක් පැනවීම තුළිනි. ස්ත්‍රියක් පෝෂණය කරන්නෙකුට විහාරයේ වාසය කිරීමට තහනම් බව දක්වයි.

මේ ආකාරයට මහජනතාවට, නිලධාරීන්, වෙහෙර විහාර සමඟ ගනුදෙනු කිරීමේ දී අනුගමනය කළ යුතු නීති රීති පිළිබඳ ව අභිලේඛන මඟින් සන්නිවේදනය කර ඇත. සම්මත නීති රීති මාලාවක් සකස් කිරීම තුළින් ආගමික



BHIKSHU UNIVERSITY OF SRI
07 APR 2015

සිද්ධස්ථාන හා රටේ පොදු මහ ජනතාව අතර සුහදශීලි බවක් ඇති කිරීම පාලකයන්ගේ අරමුණ වන්නට ඇත. හතරවන කාශ්‍යප රජුට අයත් අනුරාධපුර පුවරු ලිපිය තුළින් සමකාලීන සමාජයේ මිනිසුන් විසින් පිළිපැදිය යුතු නීති රීති ගණනාවක් ම දක්වා ඇත. විහාර ගම් බිම්වලට අයත් බිම්හි ගස් කොළන් නොකැපිය යුතු බව දක්වයි. එමෙන් ම මෙහෙකරුවන් ගැල් ගොනුන් නොගත යුතු බව දක්වයි. මේවා විහාර ගම් බිම් සම්බන්ධව සමකාලීන වැසියන්ට පැවරූ නීති රීතිය. ගහ කොළ නොකැපීම යනු විහාර ගම්වලට අදාළ වීම පමණක් නොව ඒවා මහජනතාවට එදිනෙදා ජීවිතයේ දී පවා පිළිපැදිය හැකි පිළිවෙත්ය. මේ නිසා සමාජයට ගැළපෙන සමාජ නීති රීති සමුදායක් අතීතයේ ජනතාවට අභිලේඛන මඟින් සන්නිවේදනය කළ හැකි බව පෙනේ.

කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය එවැනි සමාජ නීති රීති සන්නිවේදනය කළ තවත් අභිලේඛනයකි. එක් ගමකට අවශ්‍ය භාණ්ඩ තවත් ගමකින් නොගත යුතු බව දක්වා ඇත. කුඹුරු වපුරන්නේ නැතිව බදු ගත් අය ඒවා භුක්ති විඳීම නොකළ යුතු බව දන්වා ඇත. ගම්වල ජීවත් වන ජනතාවට පවා සන්නිවේදනය කිරීම තුළින් සමාජයේ මිනිසුන් අතර සාමය රැකීම අපේක්ෂා කරන්නට ඇත.

## ප්‍රතිඵල

එකල යහපත් සමාජ වාතාවරණයක් ඇති කරනු වස් නීතිරීති සමුදායක් ජනතාවක් වෙත සන්නිවේදනය කර ඇති බව පෙනේ. මෙයින් යහපත්, සංවිධානාත්මක සමාජයකට අවශ්‍ය පසුබිම සැකසුණ බව කිව හැකිය.

## නිගමනය

මානව සන්නිවේදනයේදී අභිලේඛන මඟින් වැදගත් මෙහෙවරක් ඉටු වී ඇති බව කිව හැකිය. හුදෙක් මෙමඟින් යහපත්, සංවිධානාත්මක, පක්ෂපාතී සමාජයක් අපේක්ෂා කරන්නට ඇතැයි සිතිය හැකි අතර මෙයින් යහපත් සමාජ පරිසරයක් එකල නිර්මාණය වන්නට ඇති බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද:** අභිලේඛන, සන්නිවේදනය, නීති රීතී, රාජ්‍ය පාලනය

## ආශ්‍රිත ග්‍රන්ථ

Wickramasinghe, D.M.D.Z. (1912) *Epigraphia Zeylanika*. Volume I, Archaelogical Surver of Ceyion. London: Oxford Univesity Press.
Wickramasinghe, D.M.D.Z. (1928). *Epigraphia Zelanica*. Volume III, Archaelogical Surver of Ceylon. London: Oxford Univesity Press.
වික්‍රමසිංහ සිල්වා. (1912) *ශිලාලේඛන සංග්‍රහය*. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.
විමලකිත්ති හිමි. (2004). *ශිලාලේඛන සංග්‍රහය 1*. කොළඹ.
අමරවංශ හිමි, කොත්මලේ. (1969). *ලක්දිව සෙල්ලිපි*. කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම .